පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව - 2019
-------------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, නියාමන සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, නියාමන සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය නියාමන සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා නියාමන සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

නියාමන සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, නියාමන සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස නියාමන සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් නියාමන සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නියාමන සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ නියාමන සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නියාමන සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

**1.5** මූල්‍ය ප්‍රකාශන

**1.5.1** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම් | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 132(අ) ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කළ මිනුම්කරණ පදනම් හෙළිදරව්කර නොතිබුණි. තවද 108 ඡේදය ප්‍රකාරව, මුළු අයභාරයේ උපවර්ගීකරණයක් අදාළ අස්ථිත්වයේ මෙහෙයුම්වලට යෝග්‍ය පරිදි වර්ගීකරණයකර ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි ගාස්තු ලෙස ලැබී තිබුණු රු.23,046,000 ක ආදායම වර්ගීකරණයකර ඉදිරිපත් කර නොතිබුණි. | මේ සම්බන්ධව ක්‍රමවේදයක් නොපවතින බව හා 2021 වර්ෂය සඳහා නව ගිණුම්කරණ පද්ධතියක් හඳුන්වාදීමට නියමිත බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර එම වත්කම්වල සධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | -එම- | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නියාමන සභාවේ නිලධාරීන් හා සේවකයින් 10 දෙනා වෙනුවෙන් පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන්කිරීමක් සිදුකර නොතිබුණි. | 2021 වර්ෂය වන විට මේ සඳහා නිසි ක්‍රමවේදයක් පිළියෙල කිරීමට නියමිත බව. | පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන්කිරීමක් සිදු කළ යුතුය. |
| (ආ) | සෘජුවම බැංකුවට ලැබෙන ලියාපදිංචි ගාස්තු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 805 කදී සෘජුවම බැංකුවට ලැබී තිබුණු මුළු එකතුව රු.8,489,500 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු නොකර අවිනිශ්චිත ගිණුමකට බැර කර තිබුණි. එසේම 2016 හා 2017 වර්ෂවලදී සෘජුවම බැංකුවට ලැබී තිබුණු රු.1,086,000 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදී සෘජු තැන්පතු ආදායම් ලෙස වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | මේ සම්බන්ධයෙන් සිදුව ඇති දෝෂයන් පිළිබඳව සාකච්ඡා කොට ඉදිරියේදී පිළිතුරු ලබාදෙන බව. | සෘජුවම බැංකුවට ලැබෙන ලියාපදිංචි ගාස්තු ආදායම් හඳුනාගෙන නියමිත පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ) දේපළ පිරියත හා උපකරණ | 3,844,044 | (i) ස්ථාවර වත්කම් ලේඛනය<br>(ii) විස්තරාත්මක උපලේඛන | ඉදිරියේදී පිළිතුරු ලබාදෙන බව. | විගණන කටයුතු සඳහා අවශ්‍ය සියලු තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) ගෙවිය යුතු දෑ | 28,582,539 | (i) කාල විශ්ලේෂණය<br>(ii) ශේෂ සනාථ කිරීම | -එම-. | -එම- |
| (ඇ) අරමුදල් මාරු ගිණුම (Fund Transfer Account) | 232,400 | උපලේඛන | -එම- | -එම- |

### 1.5.4 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නියාමන සභාව මඟින් අයකරනු ලබන ලියාපදිංචි ගාස්තු ආදායමෙන් පළාත් සභාව වෙත ප්‍රේෂණය කළ යුතු සියයට 50 ක මුදලින් රු.28,306,439 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | ලියාපදිංචි ගාස්තු ආදායමෙන් අදාළ පළාත් සභාව වෙත ප්‍රේෂණය කළ යුතු සියයට 50 පිළිබඳව සභාව විසින් තීරණය කොට ඇති නියමයන්ට අනුකූලව කටයුතු කොට ඇති බව. | මේ සම්බන්ධයෙන් පනතේ දැක්වෙන විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | අමාත්‍යාංශය භාර අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව නියාමන සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.41,904,716 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී පිළිතුරු ලබාදෙන බව. | මුදල් පනතේ 11 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 135, 136 හා 262(2) | නියාමන සභාව විසින් මූල්‍ය බලතල පැවරීමක් සිදුකර නොතිබුණි. එම හේතුවෙන් අනුමත නොකළ වවුචර් සඳහා ගෙවීම් කර තිබුණි. තවද වවුචරය මුදල් පොතෙහි සටහන් කරන දිනය, "ගෙවන ලදී" මුද්‍රාව මතුපිට සටහන් කර නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි සංග්‍රහයේ අදාළ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 431(3) | මුළු පිරිවැය රු.2,165,818 ක් වූ ආයෝජනවල ප්‍රකාශන අගය, ගැනුම් මිල, විකිණීමෙන් ලත් මුදල, ප්‍රතිඵල ලාභය හෝ අලාභය හා ලැබුණු දිනය ආදී වූ විස්තර ඇතුළත් ආයෝජන ලේඛනයක් පවත්වා නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී පිළිතුරු ලබාදෙන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ආයෝජන ලේඛනයක් පවත්වාගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ **xxiv** වැනි පරිච්ඡේදයේ **3.8, 3.14** හා **10.4** වගන්ති | උත්සව අත්තිකාරම් හා බැංකු මගින් ලබාදෙන ණය හැර සෑම ණය මුදලක් වෙනුවෙන්ම සියයට **4.2** බැගින් පොලිය මාස්පතා අය කළ යුතු වුවද, නියාමන සභාව විසින් ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් වෙත නිකුත් කර තිබුණු රු.**4,745,666** ක ණය මුදල් සඳහා පොලී අයකර නොතිබුණි. තවද ණය දීමට පෙර පොදු **272** ආකෘතිය භාවිතා කරමින් ගිවිසුමක් ලියා අත්සන් කර නොතිබුණි. එසේම නියමිත සේවා කාලයක් නොමැති ඇපකරුවන් ඇපයට තබා ගෙන රු.**2,771,666** ක ණය නිකුත් කර තිබුණි. | සේවකයන්ගේ ඉල්ලීම සලකා බලා මාස **10** ක මූලික වැටුපට සමාන ණය මුදලක් ලබාදීමට නියාමන සභාව තීරණය කර එම තීරණය කළමනාකරණ කමිටුවේදී සහ මාසික ප්‍රධාන රැස්වීමේදී අනුමත කර ඇති බව හා පොලියක් අය කිරීමට බලාපොරොත්තු වන බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. ඊට පරිබාහිරව කටයුතු කරන වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (ඈ) | **1978** දෙසැම්බර් **10** දිනැති අංක **842** දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | **2019** දෙසැම්බර් **31** දිනට පිරිවැය රු.**2,120,031** ක් වූ ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | **2021** වර්ෂය වන විට නව ක්‍රමවේදයක් හඳුන්වාදීමට නියමිත බව. | ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර එය යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| (ඉ) | **2006** ජුනි **06** දිනැති අංක **10/2006** හා **2007** නොවැම්බර් **01** දිනැති අංක **24/2007** දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | අංක **10/2006** දරන චක්‍රලේඛය, අංක **24/2007** දරන චක්‍රලේඛය මගින් අවලංගු කර තිබීම පිළිබඳව අවධානය යොමු නොකර, නිලධාරීන්ගේ ඉතිරි කරගත් නිවාඩු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.**211,550** ක් හා **2020** වර්ෂයේදී රු.**210,262** ක් ගෙවා තිබුණි. | නියාමන සභාව විසින් තීරණය කර ඇති පරිදි, සීමිත සේවක සංඛ්‍යාවක් සිටින බැවින් ඔවුන් දිරිගැන්වීමට හා පැමිණීමේ ප්‍රවනතාවය දියුණු කිරීම සඳහා ඉතිරිකරගත් නිවාඩු සඳහා දීමනාවක් ගෙවා ඇති බව. | -එම- |
| (ඊ) | **2007** මාර්තු **09** දිනැති අංක **133 (1)** දරන අයවැය චක්‍රලේඛය හා **2008** දෙසැම්බර් **31** දිනැති අංක **30/2008** දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, සේවකයෙකුට ලබාදිය යුතු උපරිම ආපදා ණය මුදල රු.**250,000** කට සීමාකර තිබුණද, ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී සේවකයින් **09** දෙනෙකු වෙත එම සීමාව ඉක්මවා රු.**1,756,666** | සේවකයන්ගේ ඉල්ලීම සලකා බලා මාස **10** ක මූලික වැටුපට සමාන ණය මුදලක් ලබාදීමට නියාමන සභාව තීරණය කර එම තීරණය කළමනාකරණ | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. ඊට පරිබාහිරව කටයුතු කරන වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් |

| | | | |
|---|---|---|---|
| | ක් ආපදා ණය නිකුත් කර තිබුණි. | කමිටුවේදී සහ මාසික ප්‍රධාන රැස්වීමේදී අනුමත කර ඇති බව හා පොලියක් අය කිරීමට බලාපොරොත්තු වන බව. | විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (උ) **2018** දෙසැම්බර් **07** දිනැති අංක **PED/03/2018** හා **2019** දෙසැම්බර් **09** දිනැති අංක **PED/03/2019** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව **2018** හා **2019** වර්ෂ සඳහා ප්‍රසාද දීමනා ගෙවීමේ හැකියාවක් නොතිබුණු නමුත් එම චක්රලේඛ විධිවිධානවලට අනුකූල නොවන පරිදි එම වර්ෂ දෙක වෙනුවෙන් රු.**445,500** ක් ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. ඊට අමතරව කිසිදු විධිමත් අනුමැතියකින් තොරව උත්සව ප්‍රසාද දීමනා ලෙස රු.**292,200** ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | අනිකුත් ආයතන හා සැසඳීමේදී සේවකයන් සඳහා ලබාදෙන දීමනා හා වරප්‍රසාද ඉතා අවම මට්ටමක පවතින නමුත් කාර්යසාධනය ඉතා ඉහල අගයක පවතින බැවින් උත්සව ප්‍රසාද දීමනාව ලබාදීමට නියාමන සභාව තීරණය කළ බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. ඊට පරිබාහිරව කටයුතු කරන වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන **3.28** ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.මිලියන **6.17** ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන **2.89** ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ වියදම රු.මිලියන **3.78** කින් අඩුවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| (අ) | **2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 2(1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, සියළුම පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි විය යුතුය. විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව, පළාත් 9 හි පෞද්ගලික වෛද්‍ය ආයතන 3,515 ක් ස්ථාපිත කර තිබුණි. කෙසේ වෙතත්, 2019 දෙසැම්බර් 31 දිනට නියාමන සභාවේ ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතන සංඛ්‍යාව 1,888 ක් පමණක් විය. ඒ අනුව ලියාපදිංචි විය යුතු පෞද්ගලික වෛද්‍ය ආයතන සංඛ්‍යාව හඳුනාගැනීමට, ලියාපදිංචි කරවීමට හා ලියාපදිංචි නොවන ආයතන සම්බන්ධයෙන් පනතේ 4 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට විධිමත් ක්‍රමවේදයක් නියාමන සභාව විසින් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණු බව නිරීක්ෂණය විය.** | **සැලකිය යුතු වෛද්‍ය ආයතන ප්‍රමාණයක් 2007 හා 2008 වර්ෂයන්හිදී ලියාපදිංචි වී ඇති බව හා පසුව ක්‍රමයෙන් ලියාපදිංචිවීම්වල අඩුවීමක් දක්නට ලැබුණද 2013 වර්ෂයේ සිට මේ දක්වා ලියාපදිංචියෙහි සීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබෙන බව, දිවයිනම ආවරණය වන සේ වෛද්‍ය ආයතන පිළිබඳ සංගණනයක් පළාත් සෞඛ්‍ය බලධාරීන්ගේ උපදේශකත්වයෙන් සහ සහභාගීත්වයෙන් සිදුකර ගෙන යනු ලබන බව, ඒ ඒ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ සුදුසුකම් ලත් නිලධාරී මණ්ඩලයක් විසින් නිසි ප්‍රමිති ඇගයීමකින් අනතුරුව ලබා දෙන නිර්දේශය සලකා බලා පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමට හා ලියාපදිංචිය වාර්ෂිකව යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව.** | **දිවයින පුරා ස්ථාපිත සියලුම පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය.** |
| (ආ) | **යථෝක්ත පනතේ 9 වගන්තිය ප්‍රකාරව, ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් පවත්වා ගෙන යායුතු ප්‍රමිති සංවර්ධනය කිරීමට හා අධීක්ෂණය කිරීමට, දැනට පවත්වාගෙන යනු ලබන ප්‍රමිති ඇගයීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට, සේවක පිරිස් බඳවා ගැනීම්වලදී අවම සුදුසුකම් අනුගමනය කරන බවට සහතිකවීමට හා සේවක පිරිස් පුහුණු කිරීමේදී අවම ප්‍රමිතීන් අනුගමනය කරන බවට වගබලා ගැනීමට සහ සපයනු ලබන රෝගීන් රැකබලා ගැනීමේ සේවාවල ගුණාත්මකභාවය තහවුරු කිරීමට විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපොහොසත්වී තිබුණි.** | **ඒ ඒ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ සුදුසුකම් ලත් නිලධාරී මණ්ඩලයක් විසින් නිසි ප්‍රමිති ඇගයීමකින් අනතුරුව ලබා දෙන නිර්දේශය සලකා බලා පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමට හා වාර්ෂිකව යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව, නියාමන සභාව විසින් ලියාපදිංචි අයදුම්පත් ඇගයීම සඳහාම පත් කර ඇති කමිටුව විසින් නිසි ප්‍රමිති ඇගයීමකින් අනතුරුව ලියාපදිංචිය සඳහා අනුමැතිය ලබා දෙන බව, සෑම පෞද්ගලික වෛද්‍ය ආයතනයක්ම ආවරණය වන පරිදි ඒවායේ නියුතු සියලුම සේවකයන්ගේ රැකියාවේ නිපුණතාවය ඇගයීම සඳහා සංගණනයක් තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ ආරම්භ කිරීමට යෝජනා වී ඇති බව හා එම වැඩසටහන කඩිනමින් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බව.** | **පනතේ 9 වගන්තිය ප්‍රකාරව කටයුතු නිමකර ගැනීමට අපොහොසත්වී ඇති බැවින්, ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කර අදාළ මාර්ගෝපදේශ රෙගුලාසි බවට පත්කර ගැනීමට කටයුතු කළ යුතුය.** |

| | | | |
|---|---|---|---|
| (ඇ) | යථෝක්ත පනතේ 13(1) වගන්තිය ප්‍රකාරව, සභාවේ උපදෙස් මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, පෞද්ගලික වෛද්‍ය ආයතන සඳහා ප්‍රතීතනය කිරීමේ යෝජනා ක්‍රමයක් ක්‍රමවත්ව දක්වා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | නියාමන සභාව ස්ථාපිත කිරීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් පිළියෙළ කර ඇති බව, පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචිය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සකසා අවම සුදුසුකම් සහ ප්‍රමිතීන් ඇතුළත්ව ඒවා රෙගුලාසි බවට පත්කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යශයේ නීති අංශය හරහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යවා ඇති බව. | පෞද්ගලික වෛද්‍ය ආයතන ප්‍රතීතනය සඳහා යෝජනා ක්‍රමයක් ක්‍රමවත්ව දක්වා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | යථෝක්ත පනතේ 18(2) උප වගන්තියේ (උ) ඡේදය ප්‍රකාරව, සම්බන්ධතාවක් දක්වන හෝ අතෘප්තියට පත් තැනැත්තකු විසින් යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයකට හෝ එයට සම්බන්ධ තැනැත්තෙකුට විරුද්ධව කරනු ලබන යම් පැමිණිල්ලක් භාර ගැනීමේදී හා එම පැමිණිල්ල අවසාන වශයෙන් බැහැර කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි හෝ පරිචයන් පිළිබඳ නියෝග පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | පෞද්ගලික වෛද්‍ය ආයතන වලට එරෙහිව මහජනතාවගේ ගැටළු ඉදිරිපත් කිරීමට හැකි අතර ඒ සඳහා කටයුතු කිරීමට නිසි මාර්ගෝපදේශයක් සකස්කොට ඇති බව. | පැමිණිල්ලක් භාර ගැනීමේදී හා එම පැමිණිල්ල අවසාන වශයෙන් බැහැර කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි හෝ පරිචයන් පිළිබඳ නියෝග පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නියාමන සභාව විසින් එකතු කරනු ලබන වාර්ෂික ලියාපදිංචි ගාස්තු ආදායමෙන් සියයට 50 ක් පළාත් ප්‍රධාන ලේකම්වරු වෙත ලබාදීමට ප්‍රථම, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක විසින් පෞද්ගලික සෞඛ්‍ය අංශ සංවර්ධනයට අදාළව වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සමඟ වාර්ෂික යෝජනාවක් ඉදිරිපත් කළ යුතු බවට හා වර්ෂය අවසානයට වියදම් හා ක්‍රියාකාරකම් පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බවට වූ විධිවිධාන ඇතුළත් කරමින් 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 3(5) වගන්තිය සංශෝධනය කිරීමට 2015 ජූලි 09 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී වර්ෂ 04 ක් ගතවී තිබුණද පනත සංශෝධනය කර නොතිබුණි. | 2011 වර්ෂය දක්වාම පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ ගාස්තු වලින් සියයට 50 ක් අදාළ පළාත් සභාව වෙත ගෙවා ඇති බව, පළාත් සභාවලට වෙනම ගිණුමක් ඇති විට පමණක් හා වසර මුලදී වාර්ෂික සැලැස්මක් ඉදිරිපත් කළ පසුව පමණක් මුදල් ගෙවිය යුතු බව 2011 පෙබරවාරි 11 දින සෞඛ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමකදී තීරණය කළ බව හා ලැබෙන මුදල් වියදම් කිරීම පිළිබඳව ප්‍රගති වාර්තාවක් නිසි පරිදි නියාමන සභාව වෙත එවිය යුතු බවට එහිදී තීරණය කළ බව හා මෙම තීරණය 2011 මාර්තු 11 දින පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවෙහි මාසික සමුළුව වෙතින් අනුමත වී ඇති බව. | 2015 ජූලි 09 දින ලැබී තිබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 3(5) වගන්තිය කඩිනමින් සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | යථෝක්ත පනතේ **3(5)** වගන්තිය ප්‍රකාරව, එකතු කරන වාර්ෂික ලියාපදිංචි ගාස්තු ආදායමෙන් සියයට **50** ක් එක් එක් පළාත් සභාව වෙත යවනු ලැබිය යුතුය. නමුත් නියාමන සභාව විසින් ලියාපදිංචි ගාස්තු ආදායමෙන් සියයට **50** ක් පළාත් සභා අරමුදලට බැර කිරීම පිණිස පළාත් ප්‍රධාන ලේකම්වරු වෙත ප්‍රේෂණය නොකර ඒ වෙනුවට පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරු වෙත ප්‍රේෂණය කර තිබුණි. එම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරු වෙත ප්‍රේෂණය කර තිබුණු රු.**8,193,874** ක් එක් එක් පළාත් සභා අරමුදල්වලට බැරවී නොතිබුණි. **2019** දෙසැම්බර් **31** දිනට එපරිදි ප්‍රේෂණය කර නොතිබුණු මුදල රු.**28,306,439** ක් විය. | -එම- | නියාමන සභාව විසින් පළාත් සභාවට ගෙවිය යුතු ලියාපදිංචි ගාස්තු ආදායමෙන් සියයට **50** ක් පළාත් සභා අරමුදලට බැර කළ යුතුය. ඒ වෙනුවට පළාත් සභාවේ සේවකයින් සඳහා වැටුප් ගෙවීම නතර කළ යුතුය. |
| (ඇ) | පළාත් සභාවල වියදම් දැරීමට කිසිදු විධිවිධානයක් පනතේ සලසා නොතිබුණු නමුත් බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අනුයුක්තව සේවය කරන නිලධාරීන්ගේ දුරකථන දීමනා, ප්‍රවාහන වියදම් සහ වැටුප් වශයෙන් ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී රු.**2,950,795** ක් නියාමන සභාව විසින් ගෙවා තිබුණි. යථෝක්ත පනතේ **3(5)** වගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතු ලියාපදිංචි ගාස්තු ආදායමෙන් එම මුදල අඩු කරගෙන තිබුණි. | බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලයට අනුයුක්තව කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති වෛද්‍යවරිය විසින් පළාත තුළ පවතින සියලුම වෛද්‍ය ආයතන පරීක්ෂා කිරීමට, පැමිණිලි විමර්ශනය කිරීමට, නිරීක්ෂණය කිරීමට, නියමිත ප්‍රමිතියෙන් හා නිසි ක්‍රමවේදයන්ට පටහැනි ආයතන පිළිබඳව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට දැනුම් දීමට හා නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලබන බැවින් ඇයගේ වැටුප් එම පළාත් සභාවට ගෙවිය යුතු සියයට **50** ක මුදලින් ගෙවන බව. | -එම- |
| (ඈ) | පෞද්ගලික වෛද්‍ය ආයතනවල සේවක පිරිස් පුහුණු කිරීමට නියාමන සභාව වෙත යථෝක්ත පනතින් බලය ලැබී නොතිබුණු නමුත්, පෞද්ගලික රෝහල්වල සේවයේ නිරත හෙද නිලධාරීන් සඳහා **Refresher Gap Filling Course** නමින් පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට **2014** මැයි **30** දින පෞද්ගලික ආරෝග්‍යශාලා හා සාත්තු නිවාස සංගමය සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමඟ එක්ව වර්ෂ **5** ක කාල සීමාවක් සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර | පෞද්ගලික වෛද්‍ය ආයතනවල නිරත සේවක පිරිස්වල සුදුසුකම් (විශේෂයෙන් වෛද්‍ය කාර්ය මණ්ඩල වල ) සභාව විසින් අධීක්ෂණ කරන බව, සභාව විසින් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමඟ හෙද පුහුණු පාඨමාලා, දන්ත ශල්‍ය පුහුණු පාඨමාලා නිසි ක්‍රමවේදයකට ක්‍රියාත්මක කරන බව, මෙම ක්‍රියාකාරකම් නිසි පරිදි අඛණ්ඩව පවත්වාගෙන යාම තුළින් පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් | පනත මගින් බලය ලැබී ඇති කටයුතු සඳහා පමණක් වියදම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. එම පුහුණු වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.2,424,698 ක් නියාමන සභාව විසින් වැයකර තිබුණි. | පිරිනමනු ලබන සේවාවන්හි ගුණාත්මක භාවය තහවුරු වන බව. | |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළදී පාලක මණ්ඩල රැස්වීම් 09 ක් පවත්වා තිබුණු අතර 28 දෙනෙකු ගෙන් සමන්විත පාලක මණ්ඩල සමාජිකයින්ගේ සාමාන්‍ය සහභාගීත්වය සියයට 58 ක් පමණක් විය. නීති අංශය නියෝජනය සඳහා පත්කර තිබුණු සමාජිකයා කිසිදු රැස්වීමකට සහභාගී වී නොතිබුණු අතර කළමනාකරන නියෝජිතයා එක් රැස්වීමකට පමණක් සහභාගී වී තිබුණි. තවත් සමාජිකයින් දෙදෙනෙකු රැස්වීම් වාර 02 කට බැගින් පමණක් සහභාගී වී තිබුණ අතර සභාපතිවරයා රැස්වීම් වාර 3 කට පමණක් සහභාගීවී තිබුණි. | සභාවේ සාමාජිකයන්ගේ පැමිණීම පිළිබඳ දත්ත වාර්තාවක් සෑම වර්ෂයකම විෂය භාර අමාත්‍යවරයා වෙත යොමු කරන බව. | පාලක මණ්ඩල රැස්වීම් සඳහා එහි සාමාජිකයින්ගේ පැමිණීම වර්ධනය කර ගත යුතුය. |
| (ඊ) | යථෝක්ත පනතේ 6(1) වගන්තිය යටතේ පත් කරන ලද පාලක මණ්ඩලයට අමතරව සමාජිකයින් 10 දෙනෙකුගෙන් යුත් කාර්යාල කළමනාකරණ කමිටුවක් පත්කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එම කමිටුවේ රැස්වීම් වාර 10 ක් පවත්වා තිබුණි. ඉන් රැස්වීම් 5 ක් සඳහා තිදෙනෙකු බැගින් පමණක් සහභාගී වී තිබුණු අතර ඉතිරි රැස්වීම් 5 සඳහා සමාජිකයින් 4 දෙනෙකු බැගින් පමණක් සහභාගීවී තිබුණි. තවද මෙම රැස්වීම් සඳහා සහභාගී වූ සමාජිකයින්ට විධිමත් අනුමැතියකින් තොරව එක් රැස්වීම් වාරයක් සඳහා රු.5,000 බැගින් දීමනා ගෙවා තිබුණි. | නියාමන සභාවේ සාමාජිකයන්ගේ රැස්වීම්වලට සහභාගී වීම නිමිත්තෙන් ගෙවනු ලබන පැමිණීමේ දීමනාව වැඩි කිරීම සඳහා 2018 ජූලි 12 වන දින පැවති කළමනාකරණ කමිටුවේ හා 2018 අගෝස්තු 10 වන දින පැවති මාසික සමුළුවේදී අනුමැතිය ලැබී ඇති බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. විධිමත් අනුමැතියකින් තොරව ගෙවා තිබුණු දීමනා ආපසු අය කළ යුතුය. |
| (උ) | නියාමන සභාව යටතේ ලියාපදිංචි කරන පෞද්ගලික වෛද්‍ය ආයතනවල ලියාපදිංචිය ප්‍රදර්ශනය කරමින් නාම පුවරු සවිකිරීම නියාමන සභාවේ කාර්යයක් නොවූවද, 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ වර්ෂ 09 කදී, පෞද්ගලික වෛද්‍ය ආයතනවල අළුත් නාමපුවරු සවිකිරීමට හා පැරණි නාම පුවරු නැවත සැකසීමට (Refill) නියාමන සභාව විසින් රු.14,655,685 ක් වැය කර තිබුණි. | අලුත් නාම පුවරු සකස් කිරීම හා පැරණි නාම පුවරු නැවත සකස් කිරීම නියාමන සභාවේ තීරණයක් පරිදි සිදු කරන බව. | පනත මගින් බලය ලැබී ඇති කටයුතු සඳහා පමණක් වියදම් කළ යුතුය. |

## 3.3 කාර්යය මණ්ඩල පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නියාමන සභාව ආරම්භ කළ වර්ෂයේ සිටම සභාව සතු කාර්යභාරය හා එහි ප්‍රමාණය හදුනාගෙන එයට ගැලපෙන ආකාරයට කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීමට හා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව තනතුරු සඳහා නිලධාරීන් **10** දෙනෙකු බඳවාගෙන තිබුණි. | ආයතනයේ කාර්යභාරය හදුනාගෙන එයට ගැලපෙන ආකාරයට බඳවා ගැනීම සඳහා නව පරිපාටිය සකස් කොට ඇති බව නමුත් සභාව විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයක් මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගත් බව. | කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීමට හා ඒ අනුව බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් නොතිබුණු බව හා වර්තමානය වන විට එය පිළියෙල කිරීමට කටයුතු කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **3.6.1** මාර්ගෝපදේශය ප්‍රකාරව, මුල් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ දින සිට මාස **6** ක කාලයක් ඉකුත්වී නොමැති විට මුල් කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට **50** ක සීමාවක් දක්වා පමණක් භාණ්ඩ නැවත ඇණවුම් කිරීමට හැකියාව ඇත. නමුත් ඊට පටහැනිව **2012** ජුනි **07** දින ලැබී තිබුණු මිල ගණන් පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා **08** කදී නැවත ලංසු කැඳවීමකින් තොරව එම සැපයුම්කරුගෙන් යළි ඇණවුම් කර විවිධ ප්‍රමාණයේ නාමපුවරු **1,268** ක් නැවත සැකසීම සඳහා රු.**1,141,400** වැයකර තිබුණි. | සෑම විටම සියලු මිලදී ගැනීම් සඳහා සැපයුම්කරුවන් කිහිප දෙනෙකුගෙන් මිල ගණන් කැඳවීමක් සිදුකර කළමනාකරණ කමිටු රැස්වීමේදී මිල ගණන් ඇගයීමකට ලක් කිරීමෙන් අනතුරුව සැපයුම්කරුවකු තෝරාගනු ලැබේ. මේ පිළිබඳව වාර්තාවක් ආයතනයේ මාසික සභා රැස්වීම සඳහාද ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සුදුසු සැපයුම්කරුවකු තෝරාගනු ලබයි. එසේම **2018** වර්ෂයේ සිට සැපයුම් කරුවන් ලියාපදිංචිය ආරම්භ කර සභාවේ අනුමැතියට යටත්ව නිසි ක්‍රමවේදයක් යටතේ ටෙන්ඩර් කැඳවා මිලදී ගැනීම් සිදුකරන බව. | -එම- |

**4.** ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

**4.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන දින 205 ක ප්‍රමාදයක් සහිතව 2020 සැප්තැම්බර් 25 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණු නමුත් කොවිඩ් 19 හේතුවෙන් පැවැත්වීමට නියමිතව තිබුණු මාසික කමිටු හා අනු කමිටු රැස්වීම් පැවැත්වීම අත්හිටවූ බැවින් මාසික සමුළුවේ අනුමැතිය ලබා ගැනීමට නොහැකි වූ බැවින් ප්‍රමාදය සිදුවූ බව. | මූල්‍ය ප්‍රකාශන කිසි කලට පිළියෙල කර නියමිත දිනට විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

**4.2** විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1), 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009 (1)(i) සහ 2019 ජනවාරි 12 දිනැති අංක DMA/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය අනුව කාර්තුවකට 01 බැගින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවත්, නියාමන සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි | 2020 නොවැම්බර් 11 වන දින පැවති මාසික සභාවේ අනුමැතිය අනුව කළමනාකරණ හා විගණන කමිටුව ලෙස විගණන කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීම පිණිස කමිටුවක් පිහිටුවා ඇති බව. | කළමනාකරණ විගණන චක්‍රලේඛය අනුව නියමිත සංයුතියෙන් සමන්විත කමිටුවක් ස්ථාපිත කර නියමිත පරිදි කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. |

**4.3** තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" පිළිබඳව නියාමන සභාව විසින් දැනුවත්වී නොතිබීම හේතුවෙන් තම විෂය | මෙම කරුණ සම්බන්ධව කරුණු සොයා බලා ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව. | නියාමන සභාව විසින් තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද |

පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

හඳුනාගැනීමට කටයුතු කළ යුතුය.